"සුරූපී" - අදාළ ද?

* සිළුමිණ - ජූනි 09, 2024

* සිරස්තලය - "රෝයල් පාක් ඝාතකයාට දුන් ජනපති සමාව මෛත්‍රීට පාරාවළලක් වූ හැටි"

* අන්තර්ගතය - "ස්වීඩන් ජාතික පියකුට සහ ශ්‍රී ලාංකික මවකට දාව එළිය දුටු සුරූපී ඉවෝන් ජොන්සන් නම් වූ සුරූපී 19 වියැති තරුණියගේ..."

ඔබේ අදහසට අනුව,

1) මෙහි මියගිය තරුණිය "සුරූපී" යැයි සඳහන් කරමින්, ඇගේ බාහිර රූපය ඉස්මතු කෙරී ඇත්තේ, මෙම පුවතේ පසුතලය ද සමඟ බලන විට, ඇයව ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කර දැක්වීමට ද?

2) මෙසේ කාන්තාවන්ගේ බාහිර ස්වරූපය ඉස්මතු කරමින්, ඔවුන් ලිංගික වස්තූන් ලෙසින් හැඟවුම්කරණය කරමින් පුවත් වාර්තා කරන්නේ, පුවතට හැඟීම් කළඹැවන සුළු (භාවාතිශය) බවක් ලබා දී, පුවතට පාඨකයින්ව ආකර්ෂණය කර ගැනීමට ද? එය කෙතරම් යෝග්‍ය මාධ්‍යකරණයක් ද?

කාන්තාවන් ලිංගික වස්තූන් ලෙසින් දක්වන වාර්තාකරණයෙන් වලකිමු!